
ඇත්ත වශයෙන් උරග ලෝකයේ සිදුවන්නේ මේ ක්‍රියාව නොවේද ? තමා ක්‍රියා කරන්නේ පැටවුන් බිහි කරන කම්හලක් ලෙසිනි. බිත්තර දැමීමක් හෝ පැටවු ප්‍රසූත කර මොහොතකට පසු එබන්දක් සිදු-වූවා දැයි පවා උරග මවට අමතක වී යනු ඇත. මෙහිදී පෙනී යන්නේ ඇගේ මොළයට ආදරය, ආලය යන හැඟීමක් නොදැනීම නොවේද ?. මේ ගැන පර්යේෂණය කළ විද්‍යාඥ-යින්ට කදිම හෝඩුවාවක් ලැබිය. එනම් උරග මොළයේ සහ වෙනත් පහළ පරිණාම තලයේ සතුන්ගේ මොළයේ ආදරයට ප්‍රතිචාරය දක්-වන මධ්‍යස්ථාන නොමැතිවීමයි. කරුණු මෙසේ නම් "ආදර ගීතය" යන්නක් උරගයින් අතර තිබිය නොහැකිය.

පරිණාමයෙන් ඉහළ තලයට යන්ම ඔක්සිටොසින් රසායනයට ප්‍රතිචාරය දක්වන මොළයේ මධ්‍යස්ථාන වර්ධනය වෙයි. කුරුලු ලෝකයේ මෙය දක්නට ඇත. කූඩු සෑදීම, බිත්තර දැමීම,පැටව් පෝෂ-ණය කිරීම ආදිය මාතෘ දරක බන්ධනයේ ලක්ෂණයකි. පැටවා වැඩී මව හැර ගිය පසු, කිරිල්ලි-යගේ "වගකීම" අවසන් වෙයි.

කිරි බී වැඩෙන සතුන්ගේ මෙම හැසිරීම් රටාව ඉහළ මට්ටමක ඇත. වචනයේ අර්ථයෙන්ම පැට-වුන්ට කිරි පොවා ඇති කිරීම මවගේ වගකීමේ කොටසකි. කලින් සඳහන් කළ මෙන් කිරි පෙවීමේ දී මාතෘ දරක බන්ධනය වැඩිවෙයි. මෙහිදී ඔක්සිටොසින් රසායනය වැඩියෙන් මොළය තුළ ජනන වන අතර, එය ඇති කරන උත්තේජනය දිගු කලක් පවතී. බොහෝ දරුවන් පෝෂණයෙන් වැඩි විය පත්වූවත්, මව අත හැර නොගොස්, ඈ කේන්-ද්‍රියව හැසිරෙති. ඇත්ත වශයෙන් මිනිස් පවුල බිහිවූයේ මෙම ක්‍රම-යෙනි.

කරුණු මෙලෙස සලකා බලන කල ඔක්සිටොසින් නම් රසායනය තද මාතෘ දරක බැඳීමක් ඇති කරයි. මේ සම්බන්ධයෙන් තවමත් පර්යේෂණ කරමින් තිබෙන අතර ඒ වර්තා පළවන අයුරින් ඔබට සපයන්නෙමු. ❑



# ලංකාවේ උතුරු පෙදෙස් ජීවත්වන බූරුවා - පරිණාමය අපට දුන් දායාදයක්

මහාචාර්ය ලක්ෂ්මන් වෛද්‍යසේකර

**"බූරුවා" යන නාමය සිංහල අපට අමුතු දෙයක් නොවේ. අනුනට වෙරවඩන සතෙකි බූරුවා. ඇමරිකානුවෝ සහ මෙක්සිකෝ වාසීහු මෙම සතාට "බූරෝ" යයි කියති.**

ලෝකයේ ජීවත්වන කැලෑ බූරු විශේෂ 8 න් උපවිශේෂ 2 ක් මෙහි සිටී. මෙයට ශතවර්ෂයකට පෙර මේ සතුන් බලුකිස්ථාන්, ඇෆ්ගනිස්ථාන් සහ සින්ද් ප්‍රදේශවල ජීවත්ව ඇත. ඉන්දියානු කැලෑ බූරුවන්ගේ ගහණය විශේෂයෙන් වැඩිවීමට හේතුව අභයභූමියක් ලෙස වෙන් කිරීමය.

බූරුවන් ලංකාවේ ගෘහාශ්‍රිතව සිටිනත් අතිකුත් රටවල, විශේෂ-යෙන්ම අපට සමීප ඉන්දියාවේ ඇත්තේ, වනගතවය. නැතහොත් වනයේ වාසය කරන කැලෑ බූරු-වන්ය. මේ සත්ත්ව දෙකොටසම ඉක්වස් (Equus) නැතහොත් අශ්ව ගණයට අයත් වේ. අප රටේ ජීවත්වන බූරුවා ඉක්වස් අප්‍රිකා-නුස්ය (Equusafricanus) ඉන්-දියාවේ ජීවත්වන බූරුවන් ඉක්වස් හෙමියොනුස් කුර් (Equus hemiouts khur) සහ ඉක්වස් හෙමියොනුස් කියැන්ග් (Equus hemiouns kiaug) ය. ලංකාවේ ගෘහස්ත ලෙස සලකන ගෘහීක-රණය කරන ලද බූරුවන් උතුරු අප්‍රිකාවේ සිට ගෙන ආ බවට සැලකේ. මෙම සතුන් අප රටට ගෙන එන ලද්දේ ලංකාවට පැමිණී අරාබි වෙළෙන්දන් බව මතයයි. පෙර සිටම මෙම සතා බඩු ගෙනයෑ-මට යොදා ගන්නා ලදී. විශේෂයෙන්ම අභිකුණ්ඨික මිනිසුන් සහ රෙදි සෝදන්නන් තම බඩු බාහිරාදිය මෙම සතාගේ පිටේ බැඳ ගෙන යෑමට යොදා ගන්නා ලදී. එහෙමත් අතිකුත් ප්‍රවාහන ක්‍රම රටට එක්වී-මෙන් පසු බූරුවන්ගේ ප්‍රයෝජනය තරමක් අත් හරින ලදී.

එහෙත් අදත් ප්‍රවාහන පහසුකම් නැති පෙදෙස්වල තවලම් වශයෙන් බූරුවන් යොදගනී.

ශ්‍රී ලංකාවේ සිටිත ඉක්වස් අප්‍රිකානුස් නම් බූරුවාගේ වාසස්ථාන ලංකාවේ උතුරෙහි ඩෙල්ගේට් කොටසටත් විශේෂයෙන් කල්පිටිය මත්තාරම පෙදෙස්වලටත් අයත්ය. එම පෙදෙස්වල මෙම සතුනට ඇති ආහාර ද ඉතා අඩුය. විශේෂයෙන් මුහුද ආශ්‍රිත වැලිකඳු යනාදිය පිහිටි තල්ගස් වැවෙන, ලවනතාව බහුල පෙදෙස් නිසා එහි ඇත්තේ ලවන ආශ්‍රිතව වැවෙන කටු ලඳු හා තණ කොළ වර්ග ය. තවද අප්‍රිකාවෙන් ලංකාවට ගෙනවුත් වැඩෙන බෂ-බාම් නැතහොත් ඇඩන්සොනියා බෝකර නැත.

ලංකාවේ ජීවත්වන බූරුවන් ගහණය අඩුවුවත් ඔවුනට සුදුසු පරිසරයක් තිබීම හිතකරය. 1859 දී ටෙනන්ට් ගේ ලංකාව ගැන ලියන ලද පොතෙහි සඳහන්ව ඇත්තේ අප්‍රිකාවේ බටහිර වෙරළ පෙදෙසින් එයට වසර සිය ගණනකට පෙර බූරුවන් ගෙනවුත් ඇති බවය.

ලංකාවේ උතුරු පෙදෙස් ඇති කලබල නිසා නිසි ගනණයක් නොමැති වුවත් අද පිරිමි සතුන් සහ ගැහැනු සතුන් දෙවර්ගයම ජීවත්වන බව පෙනේ. මෙම සතුන්ගේ ජීවත්වීම හා ඔවුන්ගෙන් සමාජයට ලැබෙන ප්‍රයෝජන අනුව පෙනීයන්නේ බූරුවා ආරක්ෂා කළ යුතු සතෙක් බවයි.

මෙම සතුන් ගැන ශ්‍රී ලංකාවේ සීමාසහිතව අධ්‍යයනයක් කර ඇති පේරාදෙණි විශ්ව විද්‍යාලයේ ආචාර්ය චාල්ස් සන්තියා පිල්ලේ මහතාට අප කෘතඥ විය යුතුය.

ලෝකයේ අනිකුත් දේශවල ජීවත්වන බූරුවන් අප රටෙහි බූරුවන්ට වඩා ප්‍රමාණයෙන් උසය. ලංකාවේ බූරුවන්ගේ උස අඩු නිසා පහසු ක්‍රමයට ප්‍රවාහන ක්‍රම සඳහා යොදගනී. ලංකාවේ වෙසෙන බූරුවන්ගේ ව්‍යුහය අනුව කන් දෙක කෙළින් ඇති අතර හිසට පහළින් විශාල ලෙස දක්වෙන උරහිස් පෙදෙසේ රේඛාවක්ද, බෙල්ල වටා ඇති රෝම දරා ඇති ඉතාමත් ශක්තිමත් රෝම වැටියක් ද සහිතය.

ඉන්දියාවේ වනගත කැලෑ බූරුවන් (ඉක්වස් හොමියෝනස්) අප රටෙහි ජීවත්වන බූරුවන්ට වඩා ප්‍රමාණයෙන් උසය. කලින් සඳහන් කළ පරිදි උප ෂ;ශ්ෂ දෙකක් ඇත. මෙම සතුන්ගේ පාරිසරික අවශ්‍යතාව නිසා ගුජරාට් පළාත් කුඩා රාන් කුච්හි කැලෑ බූරුවන්ගේ අභය භූමියක් අරඹා ඇත. වර්ග කිලෝමීටර් 5000 පමණ විශාල මෙම ප්‍රදේශය කුච්, මනස්කාන්න සුරේද්‍රනගර් හා රජ්කොට් දිස්ත්‍රික්කවලට අයත්ය. මෙහි එක් පසෙකින් කුච් මුහුදු බොක්ක වේ. මෙයට අයත්වන කාන්තාර ප්‍රදේශයක් ද ඇත. එමනිසා මෝසම් කාලගුණය සහිතව උෂ්ණ වියළි හා ශීතල කාලගුණයන් ද අයත් වේ. අදින් වසර මිලියන 230 කට පෙර මින් කොටසක් අරාබි මුහුදට අයත්ව තිබි බව පැවසේ.

ලෝකයේ ජීවත්වන කැලෑ බූරු විශේෂ 8 ත් උපවිශේෂ 2 ක් මෙහි සිටී. මෙයට ශතවර්ෂයකට පෙර මේ සතුන් බලූකිස්ථාන්, ඇෆ්ගනිස්ථාන් සහ සින්ද් ප්‍රදේශවල ජීවත්ව ඇත. ඉන්දියානු කැලෑ බූරුවන්ගේ ගහණය විශේෂයෙන් වැඩිවීමට හේතුව අභයභූමියක් ලෙස වෙන් කිරීමය. මෙම ගහණ ව්‍යාප්තිය අභයභූමිය ඇතුළත පමණක් නොව අනික් අවට පෙදෙස්වලට ව්‍යාප්තවීම දක ඇත. මෙම සතුනගේ ආහාරය ගැන අභයභූමි පර්යේෂණ අනුව විශේෂ තැනක් ගනී. මෙහිදී ප්‍රොසොපික් ෆුලිෆොරා (prosopic fulifora) නම් ශාකය වන සංරක්ෂණ ව්‍යාපෘති අනුව වගාකරන ලදී. මෙය වන ජීවීන් සඳහා වටිනා ශාකයක් නිසා අභයභූමියේ ජීවත්වන බූරුවන්ට ඉතා ප්‍රයෝජනවත්ය.

මම කැලෑ බූරුවන් වෙසෙන පෙදෙස්වල තරි ගහණයක් ඇති නිසා තරි, මෙම බූරුවන් ආහාරය සඳහා ගන්නා බවද පෙනේ. තවද මෙහි වෙසෙන කැලෑ ගෝත්‍රවලට අයත් වුවෝද මෙම බූරුවන් ආහාරයට ගනී.


ඉන්දියාවේ කැලෑ බූරුවන් ඇති මෙම පෙදෙසේ ප්‍රොසොපිස් නම් ශාකය ව්‍යාප්තවීම හා වැඩිවන ලුණු නිෂ්පාදනය යන කරුණු දෙකම අභයභූමි පෙදෙසේ පැවැත්මට බාධක බව වැටහේ.

සත්ත්ව වර්ගීකරණය අනුව ක්ෂීරපායි සත්ත්ව කොටසට අයත් මෙම සතුන් හා අශ්වයන් ද අයත් වන්නේ "පේර්සොඩැක්ටයිලා" ගෝත්‍රයටත් "ඉක්වස්" නම් ගණයටත්ය.

ලංකාවේ උතුරු පෙදෙසේ ඩෙල්ෆ්ට් දූපත් ආශ්‍රිතවත් මන්නාරම කල්පිටිය ආශ්‍රිතවත් ජීවත්වන බූරුවන් විශේෂයට ඉන්දියාවේ ජීවත්වන කැලෑ බූරුවන්ට වෙන්කර ඇති ආකාරයේ අභයභූමි ප්‍රදේශයක් වෙන්කර සැලැස්මක් ඇතිව සත්ත්ව ගහණ වැඩසටහන් දියත් කළහොත් පරිසරයටද හිතකර තත්ත්වයක් උදකළ හැකිය. ලංකාවේ ප්‍රවාහන ප්‍රශ්නයට බඩු එහා මෙහා ගෙන යැමට සහ කුඩා අවශ්‍යතාවන් සඳහා ද බූරුවා උපයෝගී කර ගන්නා සතෙක් ලෙස භාවිත කළ හැකිය.

පිටරටකින් ගෙනවුත් දූන් අපේම ක්‍රියාදමයට පිහිටක් වූ බූරුවා අශ්ව ගණයට අයිති කුඩා සතෙක් ලෙස පරිණාමය විසින් අපට දූන් දයාදයක් ලෙස සැලකිය හැකිය.

❑



ශ්‍රී ලංකාවේ සිටින ඉක්වස් අප්‍රිකානුස් නම් බූරුවාගේ වාසස්ථාන ලංකාවේ උතුරෙහි ඩෙල්ගේට් කොටසටත් විශේෂයෙන් කල්පිටිය මන්නාරම පෙදෙස්වලටත් අයත්ය. එම පෙදෙස්වල මෙම සතුනට ඇති ආහාර ද ඉතා අඩුය. විශේෂයෙන් මුහුද ආශ්‍රිත වැලිකඳු යනාදිය පිහිටි තල්ගස් වැවෙන, ලවනතාව බහුල පෙදෙස් නිසා එහි ඇත්තේ ලවන ආශ්‍රිතව වැවෙන කටු ලඳු හා තණ කොළ වර්ග ය